| දෙහිඕවිට | 9.65 | 8.54 | 3.63 | 58.61 | 58.32 | 59.56 | 30.76 | 31.66 | 27.80 | 68.79 | 69.45 | 66.65 | 70.03 | 70.81 | 67.49 | 20.30 | 20.60 | 19.32 |
| දැරණියගල | 1.93 | 1.67 | 0.86 | 83.58 | 83.66 | 83.30 | 16.77 | 17.65 | 13.79 | 64.84 | 63.99 | 67.73 | 58.07 | 57.49 | 60.02 | 3.72 | 3.60 | 4.15 |
| **එකතුව** | **23.17** | **19.60** | **13.77** | **31.56** | **31.44** | **32.02** | **24.87** | **25.84** | **21.13** | **66.80** | **75.97** | **75.57** | **78.59** | **78.52** | **78.84** | **21.15** | **21.26** | **20.75** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | | | | | | | ගොවිකාරකයකු නිරත වන සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගව පාලනය | | | එළු පාලනය | | | ඌරු පාලනය | | | කුකුළු පාලනය | | | වෙනත් සත්ත්ව පාලනයන් | | | ජලජීවී වගාව | | | | | |
| | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| රඹුක්කන | 3.09 | 3.59 | 1.26 | 0.41 | 0.46 | 0.26 | 0.13 | 0.15 | 0.07 | 4.12 | 4.35 | 3.27 | 0.06 | 0.08 | 0.00 | 0.11 | 0.13 | 0.00 | 2 | 2 | 2 |
| මාවනැල්ල | 3.17 | 3.54 | 1.67 | 1.34 | 1.50 | 0.68 | 0.00 | 0.00 | 0.00 | 4.09 | 4.37 | 2.92 | 0.18 | 0.20 | 0.10 | 0.05 | 0.06 | 0.00 | 3 | 3 | 2 |
| අරණායක | 1.39 | 1.59 | 0.54 | 0.66 | 0.74 | 0.29 | 0.00 | 0.00 | 0.00 | 2.09 | 2.26 | 1.33 | 0.04 | 0.03 | 0.05 | 0.06 | 0.08 | 0.00 | 2 | 2 | 2 |
| කෑගල්ල | 1.77 | 2.06 | 0.68 | 0.30 | 0.34 | 0.14 | 0.00 | 0.00 | 0.00 | 1.66 | 1.73 | 1.40 | 0.00 | 0.00 | 0.00 | 0.07 | 0.07 | 0.05 | 3 | 3 | 2 |
| ගලිගමුව | 2.89 | 3.27 | 1.21 | 0.51 | 0.54 | 0.38 | 0.03 | 0.04 | 0.00 | 2.97 | 3.05 | 2.63 | 0.00 | 0.00 | 0.00 | 0.02 | 0.02 | 0.00 | 3 | 3 | 3 |
| වරකාපොල | 1.90 | 2.12 | 0.91 | 0.30 | 0.34 | 0.15 | 0.02 | 0.03 | 0.00 | 1.81 | 1.91 | 1.36 | 0.03 | 0.03 | 0.04 | 0.05 | 0.04 | 0.08 | 3 | 3 | 3 |
| රුවන්වැල්ල | 2.84 | 3.32 | 1.09 | 0.62 | 0.72 | 0.27 | 0.05 | 0.03 | 0.11 | 4.02 | 4.32 | 2.90 | 0.08 | 0.07 | 0.11 | 0.20 | 0.21 | 0.16 | 3 | 3 | 3 |
| බුලත්කොහුපිටිය | 2.38 | 2.70 | 1.16 | 2.32 | 2.70 | 0.87 | 0.01 | 0.02 | 0.00 | 5.25 | 5.51 | 4.29 | 0.13 | 0.15 | 0.06 | 0.04 | 0.03 | 0.06 | 3 | 3 | 3 |
| යටියන්තොට | 1.82 | 2.09 | 0.89 | 0.79 | 0.97 | 0.18 | 0.08 | 0.11 | 0.00 | 2.77 | 3.07 | 1.73 | 0.04 | 0.05 | 0.00 | 0.12 | 0.14 | 0.06 | 3 | 3 | 2 |
| දෙහිඕවිට | 1.85 | 2.13 | 0.96 | 0.92 | 1.01 | 0.63 | 0.02 | 0.03 | 0.00 | 4.17 | 4.24 | 3.96 | 0.08 | 0.08 | 0.08 | 0.10 | 0.10 | 0.08 | 3 | 3 | 3 |
| දැරණියගල | 2.21 | 2.47 | 1.35 | 1.86 | 2.02 | 1.29 | 0.00 | 0.00 | 0.00 | 4.90 | 5.32 | 3.50 | 0.01 | 0.00 | 0.05 | 0.02 | 0.03 | 0.00 | 2 | 2 | 2 |
| **එකතුව** | **2.30** | **2.62** | **1.06** | **0.84** | **0.94** | **0.45** | **0.03** | **0.04** | **0.02** | **3.33** | **3.51** | **2.65** | **0.06** | **0.06** | **0.04** | **0.07** | **0.08** | **0.04** | **3** | **3** | **2** |

ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩවල ගොවිකාරකයින් ආර්ථික කටයුත්තක් ලෙස වී වගාවේ යෙදුණු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය 23.1% කි. මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් වී වගාවේ නිරතවූ වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය වන 34.3% ක් රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය වන 1.9% ක් වාර්තා වන්නේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ තේ වගාවේ නිරත වූ ගොවිකාරක ප්‍රතිශතය 31.5% ක් වන අතර වැඩිම ප්‍රතිශතයක් (83.5%) වාර්තා වන්නේ දැරණියගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර අඩුම ප්‍රතිශතයක් තේ වගා කරනු ලබන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වනුයේ රඹුක්කන වේ. එසේම රබර් වගාව සිදුකරනු ලබන ගොවිකාරකයින් කොට්ඨාසයේ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 24.8% ක් වේ. රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් ගොවිකාරකයින්ගෙන් 41.0% ක් රබර් වගාවේ නිරත වේ. රබර් වගාවේ නිරත අඩුම ගොවිකාරක ප්‍රතිශතයක් (13.4%) පෙන්නුම් කරනුයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.

දිස්ත්‍රික්කයේ පොල් වගාව සිදුකරනු ලබන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 66.8% ක් වන අතර එයින් වැඩිම ප්‍රතිශතය වන 87.0% වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, අඩුම ප්‍රතිශතය වන 61.3% යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩ අතුරින් වෙනත් ස්ථිර බෝග වගාකරනු ලබන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 78.5% කි. එයින් වැඩිම ප්‍රතිශතය 87.9% කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, අඩුම ප්‍රතිශතය වන 58.0% දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩවල වෙනත් කාලීන බෝග වගාව සිදුකරන ලද ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 21.1% වන අතර එහි වැඩිම ගොවිකාරකයින් ප්‍රතිශතය වන 28.0% ක් කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද අඩුම ප්‍රතිශතය වන 3.7% දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගව පාලනය සිදුකරන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 2.3% කි. වැඩි වශයෙන් ගව පාලනය සිදුකරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ මාවනැල්ල වේ. එම අගය 3.1% කි. අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම ප්‍රතිශතය වන 1.3% වාර්තාවේ. දිස්ත්‍රික්කයේ එළු පාලනය ඉතා මද වශයෙන් සිදුකරන අතර ඒහි නිරත ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 0.8% ක් වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඌරු පාලනය, ජලජීවී වගාව හා වෙනත් සත්ත්ව පාලන කටයුතු සිදුකරන ගොවිකාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රතිශත වලින් වාර්තා වී ඇත. දිස්ත්‍රික්කයේ කුකුළු පාලනය සිදුකරන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 5.2% කි. වැඩි වශයෙන් කුකුළු පාලනය සිදුකරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (5.2%) වන අතර අඩුවෙන්ම කුකුළු පාලනය සිදුකරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ කෑගල්ල (1.6%) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි.

මෙහිදී සාමාන්‍යයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයකු කෘෂිකාර්මික කටයුතු 3 ක පමණ යෙදී සිටින බව පෙන්නුම් කරයි. රඹුක්කන, අරණායක සහ දැරණියගල යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි ගොවිකාරකයකු සාමාන්‍යයෙන් කෘෂිකාර්මික කටයුතු 2ක් සිදුකරනු ලබන බව වාර්තා වන අතර අනිකුත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි ගොවිකාරකයකු නිරත වන සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු ගණන තුනකි.

## 3.11 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කෘෂිකර්මාන්තය හැර වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

ගොවිකාරකයා කෘෂිකාර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරතවේද? නැද්ද? යන්න පිළිබඳවද තොරතුරු රැස්කරන ලදි.

**වගු අංක 3.11 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**


| ප්‍රා.ලේ.කොට්ඨාසය | ගොවිකාරකයන් | | | | | |
|---|---|---|---|---|---|---|
| | වෙනත් ආර්ථික කටයුත්තක නිරත | | වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන | | මුළු ගණන | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රඹුක්කන | 8,608 | 12.72 | 3,734 | 8.80 | 12,342 | 11.21 |
| මාවනැල්ල | 7,240 | 10.70 | 2,594 | 6.11 | 9,834 | 8.93 |
| අරණායක | 6,274 | 9.27 | 4,637 | 10.93 | 10,911 | 9.91 |
| කෑගල්ල | 8,049 | 11.90 | 2,046 | 4.82 | 10,095 | 9.17 |
| ගලිගමුව | 6,230 | 9.21 | 3,690 | 8.70 | 9,920 | 9.01 |
| වරකාපොල | 9,068 | 13.40 | 5,442 | 12.83 | 14,510 | 13.18 |
| රුවන්වැල්ල | 4,882 | 7.22 | 3,632 | 8.56 | 8,514 | 7.73 |
| බුලත්කොහුපිටිය | 4,712 | 6.96 | 3,528 | 8.32 | 8,240 | 7.49 |
| යටියන්තොට | 3,464 | 5.12 | 3,910 | 9.22 | 7,374 | 6.70 |
| දෙහිඕවිට | 5,731 | 8.47 | 4,475 | 10.55 | 10,206 | 9.27 |
| දැරණියගල | 3,395 | 5.02 | 4,740 | 11.17 | 8,135 | 7.39 |
| **එකතුව** | **67,653** | **100.00** | **42,428** | **100.00** | **110,081** | **100.00** |

ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ සිටින මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව අතරෙන් කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත වන ගොවි කාරකයින් සංඛ්‍යාව 67,653ක් වන අතර වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන ගොවි කාරකයින් සංඛ්‍යාව 42,428 කි.

කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත වන වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව (9,068) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එහි ප්‍රතිශතය 13.4% කි. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව (3,395) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එහි ප්‍රතිශතය 5.0% කි .

එම දිස්ත්‍රික්කයේ පදිංචි මුළු ගොවිකාරකයින්ගෙන් කෘෂිකාර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන ගොවිකාරකයින්ගේ වැඩිම සංඛ්‍යාව (5,442) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර ප්‍රතිශතයක් ලෙස ගත් කල 12.8% කි. වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන ගොවිකාරකයින්ගේ අඩුම සංඛ්‍යාව (2,046) කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම අගය ප්‍රතිශතයක් ලෙස 4.8% කි .

**රූප සටහන 09 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් - 2014**



## 3.12 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් රැකියාවන් සහ ආදායම් මාර්ග හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

2014 වර්ෂයේ දී සිදුකළ ආර්ථික සංගණනය යටතේ, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ දී ගොවිකාරකයන්ගේ, කෘෂිකර්මාන්තය හැර වෙනත් ආර්ථික කටයුතුවල නිරත වීම හෙවත් ඔවුන්ගේ ප්‍රධාන රැකියාව පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් එක් රැස් කරන ලදී. මෙහි දී ගොවිකාරකයින් වැටුප් ලබන රැකියාවක නිරත වන්නේ ද, තමන්ගේ ආර්ථික කටයුත්තක නිරත වන්නේ ද, සේවා යෝජකයෙක් වශයෙන් නිරත වන්නේ ද සහ වෙනත් ආදායම් මාර්ග වල නිරත වන්නේ ද යන තොරතුරු ලබා ගන්නා ලදී. ඊට අමතරව වැටුප් ලබන රැකියාවක නිරත වන ගොවි කාරකයින් නියුක්ත වන අංශය රජයේ, අර්ධ රජයේ සහ පුද්ගලික අංශයේ වශයෙන් හා තමාගේම ආර්ථික කටයුත්තක නිරත වන ගොවි කාරකයින් නිරත වන ආර්ථික කටයුත්ත කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන යනුවෙන්ද තොරතුරු ලබා ගන්නා ලදී.

**වගු අංක 3.12 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් රැකියාවන් සහ ආදායම් මාර්ග හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | වැටුප් ලබන රැකියාවක නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය අංශය | | | අර්ධ රාජ්‍ය අංශය | | | පුද්ගලික අංශය | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| රඹුක්කන | 1855 | 337 | 2192 | 208 | 29 | 237 | 1643 | 226 | 1869 | 3706 | 592 | 4298 |
| මාවනැල්ල | 1101 | 190 | 1291 | 136 | 20 | 156 | 1715 | 259 | 1974 | 2952 | 469 | 3421 |
| අරණායක | 1020 | 162 | 1182 | 113 | 17 | 130 | 1224 | 156 | 1380 | 2357 | 335 | 2692 |
| කෑගල්ල | 1225 | 194 | 1419 | 191 | 26 | 217 | 1516 | 267 | 1783 | 2932 | 487 | 3419 |
| ගලිගමුව | 981 | 120 | 1101 | 159 | 9 | 168 | 1773 | 229 | 2002 | 2913 | 358 | 3271 |
| වරකාපොල | 1334 | 153 | 1487 | 264 | 21 | 285 | 2916 | 421 | 3337 | 4514 | 595 | 5109 |
| රුවන්වැල්ල | 639 | 101 | 740 | 177 | 20 | 197 | 1006 | 122 | 1128 | 1822 | 243 | 2065 |
| බුලත්කොහුපිටිය | 539 | 70 | 609 | 67 | 10 | 77 | 1894 | 319 | 2213 | 2500 | 399 | 2899 |
| යටියන්තොට | 249 | 52 | 301 | 111 | 10 | 121 | 1125 | 215 | 1340 | 1485 | 277 | 1762 |
| දෙහිඕවිට | 571 | 113 | 684 | 104 | 13 | 117 | 2380 | 367 | 2747 | 3055 | 493 | 3548 |
| දැරණියගල | 396 | 73 | 469 | 129 | 15 | 144 | 726 | 136 | 862 | 1251 | 224 | 1475 |
| **එකතුව** | **9910** | **1565** | **11475** | **1659** | **190** | **1849** | **17918** | **2717** | **20635** | **29487** | **4472** | **33959** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | තමන්ගේ ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත | | | තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| රඹුක්කන | 576 | 188 | 764 | 863 | 163 | 1026 | 1439 | 351 | 1790 |
| මාවනැල්ල | 792 | 181 | 973 | 784 | 166 | 950 | 1576 | 347 | 1923 |
| අරණායක | 758 | 196 | 954 | 933 | 178 | 1111 | 1691 | 374 | 2065 |
| කෑගල්ල | 562 | 176 | 738 | 916 | 169 | 1085 | 1478 | 345 | 1823 |
| ගලිගමුව | 496 | 99 | 595 | 596 | 91 | 687 | 1092 | 190 | 1282 |
| වරකාපොල | 936 | 224 | 1,160 | 1011 | 136 | 1147 | 1947 | 360 | 2307 |
| රුවන්වැල්ල | 445 | 157 | 602 | 770 | 144 | 914 | 1215 | 301 | 1516 |
| බුලත්කොහුපිටිය | 631 | 198 | 829 | 493 | 82 | 575 | 1124 | 280 | 1404 |
| යටියන්තොට | 628 | 146 | 774 | 352 | 57 | 409 | 980 | 203 | 1183 |
| දෙහිඕවිට | 513 | 199 | 712 | 521 | 78 | 599 | 1034 | 277 | 1311 |
| දැරණියගල | 802 | 209 | 1,011 | 330 | 46 | 376 | 1132 | 255 | 1387 |
| **එකතුව** | **7,139** | **1973** | **9,112** | **7569** | **1,310** | **8879** | **14708** | **3,283** | **17991** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | සේවායෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සේවා යෝජක | | | වෙනත් | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| රඹුක්කන | 137 | 20 | 157 | 1860 | 503 | 2363 | 1997 | 523 | 2520 |
| මාවනැල්ල | 44 | 5 | 49 | 1472 | 375 | 1847 | 1516 | 380 | 1896 |
| අරණායක | 66 | 11 | 77 | 1139 | 301 | 1440 | 1205 | 312 | 1517 |
| කෑගල්ල | 94 | 27 | 121 | 2070 | 616 | 2686 | 2164 | 643 | 2807 |
| ගලිගමුව | 103 | 9 | 112 | 1294 | 271 | 1565 | 1397 | 280 | 1677 |
| වරකාපොල | 134 | 17 | 151 | 1222 | 279 | 1501 | 1356 | 296 | 1652 |
| රුවන්වැල්ල | 65 | 6 | 71 | 1068 | 162 | 1230 | 1133 | 168 | 1301 |
| බුලත්කොහුපිටිය | 43 | 5 | 48 | 311 | 50 | 361 | 354 | 55 | 409 |
| යටියන්තොට | 23 | 5 | 28 | 391 | 100 | 491 | 414 | 105 | 519 |
| දෙහිඕවිට | 78 | 26 | 104 | 623 | 145 | 768 | 701 | 171 | 872 |
| දැරණියගල | 34 | 5 | 39 | 381 | 113 | 494 | 415 | 118 | 533 |
| **එකතුව** | **821** | **136** | **957** | **11831** | **2,915** | **14746** | **12652** | **3,051** | **15703** |

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින්ගෙන් වැටුප් සහිත රැකියාවන්වල නිරතවන සංඛ්‍යාවෙන් වැඩිම සංඛ්‍යාවක් (20,635) වාර්තා වී ඇත්තේ පෞද්ගලික අංශයෙනි. අඩුම සංඛ්‍යාව (1,849) ක් සේවයෙහි නිරත බවට වාර්තා වන්නේ අර්ධ රාජ්‍ය අංශයෙහි රැකියාවන්වල වේ. රාජ්‍ය අංශයෙහි සේවයේ නිරත සංඛ්‍යාව (11,475) කි.

පෞද්ගලික අංශයෙහි රැකියාවල නිරත සංඛ්‍යාවෙන් වැඩිම අගය (3,337) වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති අතර අඩුම සංඛ්‍යාව (862) දැරණියගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇත. අර්ධ රාජ්‍ය අංශයෙහි රැකියා කරන ගොවිකාරකයින්ගෙන් ඉහළම අගය (285) වරකාපොළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළින් වාර්තා වී ඇත.

රාජ්‍ය අංශයේ රැකියාවල නිරත ගොවිකාරකයින්ගේ ස්ත්‍රී / පුරුෂ භාවය සැළකීමේ දී එයින් වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තා වන්නේ පුරුෂ පක්ෂයෙන් වන අතර එම පිරිස සංඛ්‍යාත්මකව

(9,910) ක් බවට වාර්තා වේ. එම අගය රාජ්‍ය අංශයේ රැකියා වල නිරත වන්නන්ගේ මුළු ගණනින් 86.3% ක ප්‍රතිශතයකි. කාන්තාවන් සම්බන්ධව එම අගය 1,565 වන අතර ප්‍රතිශතය 13.6%ක් වේ.

රාජ්‍ය අංශයේ ආදායම් ලබන පිරිමි රැකියා නියුක්තියෙන් ඉහළ ම අගයක් (1,855) රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. මෙහි අඩුම ගොවිකාරකයින් (249) ගණන රාජ්‍ය අංශයේ සේවය කරන පිරිමි ගොවිකාරකයින්ගෙන් 2.5% ප්‍රතිශතයක් වන අතර යටියන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ වාර්තා වේ. රාජ්‍ය සේවයෙහි කාන්තාවන් වැඩිම සංඛ්‍යාව (337) වාර්තා වන්නේද රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය රාජ්‍ය අංශයෙහි සේවය කරන කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 21.5% ක් වේ. යටියන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් රාජ්‍ය සේවයෙහි නිරත කාන්තාවන්ගේ අඩුම අගය (52) වාර්තා වේ.

අර්ධ රාජ්‍ය අංශයෙහි වැඩිම සංඛ්‍යාව පිරිමි ගොවිකාරකයින් වන බව වාර්තා වේ. එය අර්ධ රාජ්‍ය අංශයෙහි සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් වශයෙන් 89.7% ක් වන අතර සංඛ්‍යාත්මකව 1,659 ක් වේ. එම අංශයෙහි වැඩිම සංඛ්‍යාව (264) වාර්තා වන්නේ වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි වන අතර අඩුම අගය (67) බුලත්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. මෙම අඩුම අගය අර්ධ රාජ්‍ය අංශයෙහි වැටුප් ලබන රැකියාවල නියුතු පිරිමි ගොවිකාරකයින් ගණනින් 4.0 % ක ප්‍රතිශතයක් වේ. රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් අර්ධ රාජ්‍ය අංශයෙහි ස්ත්‍රී සේවා දායකත්වයේ වැඩිම අගය (29) වාර්තා වන අතර එය අර්ධ රාජ්‍ය අංශයෙහි ස්ත්‍රී ගොවිකාරකයින් ගණනින් 15.2% ක් වේ.

කෘෂිකාර්මික කටයුතු හැර වෙනත් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ගොවිකාරකයින්ගෙන් පෞද්ගලික අංශයෙහි සේවයේ නියැලී සිටින්නන් සළකා බැලීමේ දී එම සංඛ්‍යාවෙන් 86.8% ප්‍රතිශතයක් පිරිමි වන අතර එය 17,918 අගයක් ගනී. පෞද්ගලික අංශයෙහි රැකියා කරන පිරිමි වැඩිම අගයක් (2,916) වාර්තා වන්නේ වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වන අතර 16.2% ප්‍රතිශතයක් වේ. අඩුම අගය වන (726) දැරණියගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් පෞද්ගලික අංශයේ වැඩිම කාන්තා සේවා දායකත්වයක් (421) වාර්තා වන අතර එය එම අංශයේ මුළු ස්ත්‍රී ගොවිකාරකයින් ගණනින් 15.4% ක ප්‍රතිශතයක් පෙන්වයි.

වර්ෂ 2014 කෘෂිකාර්මික තොරතුරු අනුව ගොවිකාරකයින් තමාගේම ආර්ථික කටයුතුවල නිරත වීම පිළිබඳ තොරතුරු සලකා බැලීමේ දී ගොවිකාරකයින් තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත වන්නේ ද නොඑසේ නම් තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත වන්නේද යන තොරතුරු සොයා බලන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ තමාගේම ආර්ථික කටයුත්තක නිරත වන සංඛ්‍යාව වන 17,991 න් වැඩිම ප්‍රතිශතයක් වන 50.6% තමාගේම කෘෂිකාර්මික ආර්ථික කටයුත්තක නිරත වන අතර එය සංඛ්‍යාත්මකව 9,112 කි. තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත වන ගොවිකාරකයන් ගණන 8,879 ක් වේ.

තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත ගොවිකාරකයින් සලකා බැලීමේ දී එහි වැඩිම සංඛ්‍යාව (7,139) පිරිමි ගොවිකාරකයින් නියෝජනය කරන අතර එය 78.3% ක ප්‍රතිශතයකි. ස්ත්‍රීන් ගණන 1973 ක් වේ. පිරිමි ගොවිකාරකයින්ගේ ද වැඩිම සංඛ්‍යාව (936) වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එය 13.1% ප්‍රතිශතයක් වේ. රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම අගය (445) වාර්තා කරයි. තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත කාන්තා ගොවිකාරකයින් වැඩිම සංඛ්‍යාව (224) වරකාපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ.

තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත ගොවිකාරකයින් පිළිබඳ වාර්තා අනුව ද පුරුෂ ගොවිකාරකයින් වැඩි අගයක් ගන්නා බව පෙන්වා දිය හැකිය. ඒ අනුව පුරුෂ ගොවිකාරකයින් 7,569 ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් 1,310 ක් වේ. පුරුෂ ගොවිකාරකයින් සළකා බැලීමේ දී වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිම සංඛ්‍යාවක් (1,011) වාර්තා වන අතර එය කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 13.3% ප්‍රතිශතයක් පෙන්වයි. දැරණියගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම අගය (330) වාර්තා වන අතර කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 4.3% ක ප්‍රතිශතයක් පෙන්වයි. ස්ත්‍රී ගොවිකාරකයින්ගේ ද වැඩිම අගය (178) අරණායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 13.5% ක ප්‍රතිශතයක් පෙන්වයි.

ගොවිකාරකයින්, සේවා යෝජකයන් ලෙස ඔවුන්ගේ ආදායම් මාර්ග ශක්තිමත් කර ගෙන තිබේද? එසේ නොමැති නම් වෙනත් ආදායම් මාර්ගයක් තම ආදායම් මාර්ගය ලෙස තෝරාගෙන තිබේද? යන කරුණ සම්බන්ධයෙන් ද 2014 ආර්ථික සංගණයේ දී තොරතුරු ලබා ගන්නා ලදී.

සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග සම්බන්ධයෙන් තොරතුරු සලකා බැලීමේ දී කෑගල්ල දිස්ත්‍රික්කයේ එවැනි ආදායම් මාර්ග ඇති ගොවි කාරකයන් ගණන 15,703 ක් ලෙස වාර්තා වේ. එම සංඛ්‍යාවෙන් 80.5% ප්‍රතිශතයක් පුරුෂ ගොවිකාරකයින් වේ. සමස්ථයක් ලෙස සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල ස්වභාවය සැලකීමේදී වැඩිම පිරිමි ගොවිකාරකයින් නියෝජනය දක්නට ලැබෙන්නේ කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය සංඛ්‍යාත්මකව 2,164 ක් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 17.1% ක ප්‍රතිශතයකි. අඩුම පිරිමි සංඛ්‍යාව (354) වාර්තා වන්නේ බුලත්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 2.8% ක ප්‍රතිශතයකි. කාන්තාවන් වැඩිම ගණනක් (643) කෑගල්ල ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 21.0% ක ප්‍රතිශතයක් වේ. අඩුම ස්ත්‍රී සංඛ්‍යාව (55) වාර්තා වන්නේ බුලත්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.8% ක ප්‍රතිශතයකි.

සේවා යෝජකයන් හා වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයන් යන කාණ්ඩ දෙක සලකා බැලීමේදී වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයන් ගණන වැඩි අගයක් (14,746) ගෙන ඇති බව පෙන්වා දිය හැකිය. එය 93.9% ක් වේ. සේවා යෝජකයන් සිටිනුයේ 957 දෙනෙකු පමණි.

සේවා යෝජකයන්ගෙන් ද පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගනී. එම අගය 821 ක් වන විට කාන්තා ගොවිකාරකයින් 136 ක් පමණක් වාර්තා වේ. පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 16.6% ක ප්‍රතිශත අගය වන 137 දෙනෙකු රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වාර්තා වන අතර අඩුම පුරුෂ ගොවිකාරකයන් සංඛ්‍යාව (23) යටියන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. කාන්තා සේවායෝජකයන්ගෙන් ඉහළම අගය වන 27 ක් වාර්තා වනුයේ කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන්ය.

වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයින් ද වැඩි සංඛ්‍යාව (11,831) පිරිමි ගොවිකාරකයින් වන විට කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාව 2,915 ක් ලෙස වාර්තා වේ. එම පිරිමි ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 17.4% ක ප්‍රතිශතයක් වන 2,070 දෙනෙකු කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර අවම අගය (311) බුලත්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2.6% කි. කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි වෙනත් ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් වැඩිම සංඛ්‍යාව (616) ක් වාර්තා වන අතර එය, එම ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 21.1% ක ප්‍රතිශතයකි. බුලත්කොහුපිටිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙනත් ආදායම් මාර්ග සහිත අඩුම කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවක් (50) වාර්තා වන අතර එය එම ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.7% ක් වේ.

### 3.13: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/කටයුතුවල නිරත වන කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

වෙනත් ආර්ථික කටයුතුවල යෙදෙන ගොවිකාරකයන්, කෘෂිකර්මාන්තයට වඩා වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කළේද? යන්න පිළිබඳව තොරතුරු රැස් කරක ලදී.

**වගු අංක 3.13 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/ කටයුතුවල නිරත කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | ගොවි කාරකයන් | | | |
|---|---|---|---|---|
| | වැඩි කාලයක් වෙනත් ආර්ථික කටයුතුවල නිරතවන | වැඩි කාලයක් කෘෂිකාර්මික කටයුතුවල නිරතවන | කාලය සඳහන් නොකරන ලද, එහෙත් වෙනත් ආර්ථික කටයුතුවල නිරත වන | මුළු ගණන |
| රඹුක්කන | 4041 | 1124 | 3443 | 8608 |
| මාවනැල්ල | 3490 | 1380 | 2370 | 7240 |
| අරණායක | 3161 | 1237 | 1876 | 6274 |
| කෑගල්ල | 3877 | 1032 | 3140 | 8049 |
| ගලිගමුව | 3521 | 1054 | 1655 | 6230 |
| වරකාපොල | 5103 | 1328 | 2637 | 9068 |
| රුවන්වැල්ල | 2425 | 498 | 1959 | 4882 |
| බුලත්කොහුපිටිය | 2731 | 845 | 1136 | 4712 |
| යටියන්තොට | 1352 | 877 | 1235 | 3464 |
| දෙහිඕවිට | 3361 | 1399 | 971 | 5731 |
| දැරණියගල | 1052 | 1478 | 865 | 3395 |
| **එකතුව** | **34114** | **12252** | **21287** | **67653** |

ඒ අනුව ගොවිකාරකයා වෙනත් ආර්ථික කටයුතුවල නියැලෙන කාලය පිළිබඳව සලකා බැලීමේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩි ගොවිකාරකයන් පිරිසක් කෘෂිකර්මාන්තයට වඩා වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කළ අය වේ. එය සංඛ්‍යාත්මකව 34,114 කි. වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ගොවිකාරකයන් සංඛ්‍යාව 12,252 වේ. වෙනත් ආර්ථික කටයුතුවල නිරත වුවද, එම කාලය සඳහන් නොකරන ලද ගොවිකාරකයන් සංඛ්‍යාව 21,287 කි.


වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කරන ගොවිකාරකයන්ගෙන් වැඩිම සංඛ්‍යාව දක්නට ලැබෙන්නේ වරකාපොල (5,103) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එහි අඩුම සංඛ්‍යාව දැරණියගල (1052) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ.

වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින වැඩිම ගොවිකාරකයන් සංඛ්‍යාව දැරණියගල (1478) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. ඒ යටතේ අඩුම ගොවිකාරකයන් සංඛ්‍යාව රුවන්වැල්ල (498) ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ .

කාලය සඳහන් නොකරන ලද, වෙනත් ආර්ථික කටයුතුවල නිරත ගොවිකාරකයන්ගේ වැඩිම සංඛ්‍යාව දක්නට ලැබෙන්නේ රඹුක්කන (3,443) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. කාලය සඳහන් නොකරන ලද, වෙනත් ආර්ථික කටයුතුවල නිරත අවම ගොවිකාරකයින් සංඛ්‍යාව වන (865) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් වාර්තා වේ .

දිස්ත්‍රික් මට්ටමින් සලකා බලන විට වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කරන ගොවිකාරකයන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 50.4% කි. වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ගොවි කාරකයන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 18.1% කි. කාලය සඳහන් නොකරන ලද, එහෙත් වෙනත් ආර්ථික කටයුතුවල නිරත ගොවි කාරකයන්ගේ සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 31.4% කි.

**රූප සටහන 10 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/කටයුතුවල නිරත කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**



## 3.14 : කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් සතු වෙනත් දිස්ත්‍රික්කවල පිහිටි බිම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය - 2014

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි පදිංචි ගොවිකාරකයින්ට අයත් කෑගල්ල දිස්ත්‍රික්කයෙහි සහ අනෙකුත් දිස්ත්‍රික්ක වල පිහිටි බිම් කැබලි හා බිම් ප්‍රමාණයන්, බිම් කැබැල්ලේ විශාලත්වය අනුව මෙමගින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.14 : කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් සතු වෙනත් දිස්ත්‍රික්කවල පිහිටි බිම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය - 2014**

| දිස්ත්‍රික්කය | කැබැල්ලේ විශාලත්වය අනුව බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1 ට අඩු | | අක්කර 1 -2 අතර | | අක්කර 2-3 අතර | | අක්කර 3-4 අතර | | අක්කර 4-5 අතර | |
| | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 19 | 5 | 2 | 3 | 2 | 5 | 0 | 0 | 0 | 0 |
| ගම්පහ | 64 | 22 | 17 | 20 | 13 | 30 | 2 | 6 | 4 | 17 |
| කළුතර | 4 | 1 | 0 | 0 | 2 | 4 | 0 | 0 | 0 | 0 |
| මහනුවර | 40 | 13 | 31 | 34 | 14 | 31 | 8 | 25 | 1 | 5 |
| මාතලේ | 2 | 1 | 5 | 6 | 3 | 7 | 0 | 0 | 0 | 0 |
| නුවරඑළිය | 12 | 5 | 25 | 26 | 10 | 21 | 0 | 0 | 2 | 9 |
| ගාල්ල | 0 | 0 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| මාතර | 4 | 1 | 3 | 3 | 1 | 2 | 0 | 0 | 0 | 0 |
| හම්බන්තොට | 0 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| යාපනය | - | - | - | - | 1 | 2 | - | - | - | - |
| මන්නාරම | 7 | 3 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වවුනියාව | 1 | 1 | 1 | 1 | 2 | 4 | 1 | 3 | 0 | 0 |
| අම්පාර | 6 | 3 | 3 | 3 | 1 | 2 | 1 | 3 | 1 | 4 |
| ත්‍රිකුණාමලය | 0 | 0 | 1 | 1 | 1 | 2 | 0 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 157 | 59 | 55 | 66 | 27 | 57 | 11 | 35 | 15 | 0 |
| පුත්තලම | 5 | 2 | 3 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| අනුරාධපුරය | 6 | 3 | 4 | 4 | 5 | 12 | 1 | 3 | 0 | 0 |
| පොළොන්නරුව | 5 | 3 | 4 | 5 | 4 | 8 | 7 | 23 | 0 | 0 |
| බදුල්ල | 3 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| මොණරාගල | 6 | 2 | 2 | 3 | 4 | 9 | 0 | 0 | 0 | 0 |
| රත්නපුර | 34 | 15 | 21 | 25 | 9 | 18 | 3 | 10 | 1 | 4 |
| කෑගල්ල | 149777 | 57813 | 40170 | 46784 | 10961 | 23391 | 2953 | 9257 | 1362 | 5603 |
| **එකතුව** | **150152** | **57952** | **40352** | **46991** | **11060** | **23605** | **2987** | **9365** | **1386** | **5640** |

| දිස්ත්‍රික්කය | කැබැල්ලේ විශාලත්වය අනුව බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 5-10 අතර | | අක්කර 10 -20 අතර | | අක්කර 20-50 අතර | | අක්කර 50 ට වැඩි | | මුළු සංඛ්‍යාව | | |
| | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | % |
| කොළඹ | 1 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 24 | 17 | **0.0** |
| ගම්පහ | 2 | 16 | 2 | 20 | 0 | 0 | 0 | 0 | 104 | 131 | **0.1** |
| කළුතර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | 5 | **0.0** |
| මහනුවර | 4 | 28 | 3 | 38 | 0 | 0 | 0 | 0 | 101 | 174 | **0.1** |
| මාතලේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 10 | 14 | **0.0** |
| නුවරඑළිය | 0 | 0 | 1 | 10 | 0 | 0 | 0 | 0 | 50 | 71 | **0.0** |
| ගාල්ල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 2 | **0.0** |
| මාතර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 6 | **0.0** |
| හම්බන්තොට | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 2 | **0.0** |
| යාපනය | - | - | - | - | - | - | - | - | 1 | 2 | **0.0** |
| මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 5 | **0.0** |
| වවුනියාව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 | 9 | **0.0** |
| අම්පාර | 2 | 11 | 1 | 12 | 0 | 0 | 0 | 0 | 15 | 38 | **0.0** |
| ත්‍රිකුණාමලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 3 | **0.0** |
| කුරුණෑගල | 23 | 163 | 6 | 68 | 0 | 0 | 0 | 0 | 294 | 509 | **0.3** |
| පුත්තලම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 5 | **0.0** |
| අනුරාධපුරය | 3 | 19 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 19 | 40 | **0.0** |
| පොළොන්නරුව | 3 | 18 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 23 | 57 | **0.0** |
| බදුල්ල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 2 | **0.0** |
| මොණරාගල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 12 | 13 | **0.0** |
| රත්නපුර | 4 | 27 | 2 | 24 | - | - | - | - | 74 | 123 | 0.1 |
| කෑගල්ල | 2086 | 13392 | 564 | 7251 | 22 | 618 | 0 | 0 | 207895 | 164,108 | **99.3** |
| **එකතුව** | **2,128** | **13,678** | **579** | **7,423** | **22** | **618** | **-** | **-** | **208,666** | **165,334** | **100.0** |

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි පදිංචි ගොවිකාරකයින්ට අයත් කෑගල්ල සහ අනෙකුත් දිස්ත්‍රික්ක වල පිහිටි මුළු බිම් කැබලි ගණන 208,666 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 165,334 කි. එම මුළු බිම් කැබලි ප්‍රමාණයෙන් වැඩිම බිම් කැබලි ගණන (207,895) හා එම මුළු බිම් ප්‍රමාණයෙන් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 164,108 ) කෑගල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති බවට වාර්තා වේ. එහි ප්‍රතිශත සැලකූ විට පිළිවෙලින් එය 99.3% කි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ පදිංචි ගොවිකාරකයන් සතු වෙනත් දිස්ත්‍රික්කවල ඇති බිම් කැබලි ප්‍රමාණය 771 ක් වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 1,226 ක් වේ. කුරුණෑගල, ගම්පහ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල බිම් කැබලි පිළිවෙලින් 294,104 සහ 101 ලෙස වන අතර බිම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 509, 131 සහ 174 ලෙස දැක්විය හැකිය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ පදිංචි ගොවිකාරකයන් සතු වෙනත් දිස්ත්‍රික්කවල ඇති බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණ පිළිබද සැලකීමේදී අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණය යටතේ බිම් කැබලි 375 ක් හා බිම් ප්‍රමාණය අක්කර 139, අක්කර 1-2 අතර බිම් කැබලි 182 ක් හා බිම් ප්‍රමාණය අක්කර 207, අක්කර 2-3 අතර බිම් කැබලි 99 ක් හා බිම් ප්‍රමාණය අක්කර 214, අක්කර 3-4 අතර බිම් කැබලි 34 ක් හා බිම් ප්‍රමාණය අක්කර 108, අක්කර 4-5 අතර බිම් කැබලි 24 ක් හා බිම් ප්‍රමාණය අක්කර 38, අක්කර 5-10 අතර බිම් කැබලි 42 ක් හා බිම් ප්‍රමාණය අක්කර 286, අක්කර 10-20 අතර බිම් කැබලි 15 ක් හා බිම් ප්‍රමාණය අක්කර 172, අක්කර 20-50 අතර බිම් කැබලි සහ අක්කර 50 ට වැඩි කිසිදු බිම් කැබල්ලක් වාර්තාවී නොමැත.

## 3.15 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව - 2014

කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව මෙමගින් පෙන්නුම් කරයි.

**වගු අංක 3.15: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලිවල හිමිකාරීත්වය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කැබලි 1 | කැබලි 2 | කැබලි 3 | කැබලි 4 | කැබලි 5 | කැබලි 6 | කැබලි 7 | කැබලි 8 | කැබලි 9 | කැබලි 10 හෝ ඊට වැඩි | මුළු ගණන |
| රඹුක්කන | 4940 | 3839 | 1747 | 810 | 373 | 202 | 104 | 67 | 40 | 67 | **12189** |
| මාවනැල්ල | 4500 | 3072 | 1218 | 521 | 231 | 114 | 62 | 36 | 19 | 34 | **9807** |
| අරණායක | 5246 | 3191 | 1299 | 583 | 264 | 146 | 79 | 36 | 26 | 35 | **10905** |
| කෑගල්ල | 5115 | 2657 | 1180 | 546 | 258 | 130 | 63 | 49 | 29 | 46 | **10073** |
| ගලිගමුව | 4496 | 2631 | 1345 | 616 | 340 | 166 | 121 | 60 | 51 | 68 | **9894** |
| වරකාපොල | 6484 | 3935 | 1952 | 942 | 498 | 267 | 141 | 93 | 67 | 112 | **14491** |
| රුවන්වැල්ල | 4750 | 2177 | 805 | 329 | 170 | 102 | 65 | 28 | 24 | 34 | **8484** |
| බුලත්කොහුපිටිය | 5028 | 2002 | 626 | 248 | 131 | 63 | 38 | 16 | 12 | 15 | **8179** |
| යටියන්තොට | 4983 | 1644 | 427 | 160 | 57 | 27 | 9 | 6 | 4 | 6 | **7323** |
| දෙහිඕවිට | 6630 | 2379 | 744 | 240 | 95 | 42 | 25 | 13 | 6 | 14 | **10188** |
| දැරණියගල | 5007 | 2049 | 679 | 203 | 80 | 35 | 11 | 10 | 2 | 6 | **8082** |
| **එකතුව** | **57179** | **29576** | **12022** | **5198** | **2497** | **1294** | **718** | **414** | **280** | **437** | **109615** |

කෑගල්ල දිස්ත්‍රික්කයේ බහුතරයක් ගොවි කාණ්ඩ හිමිකම් කියනු ලබන බිම් කැබලි ගණන එකකි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 57,179 වේ. බිම් කැබලි ගණන 1ක් සහිත ගොවි කාණ්ඩ වැඩි සංඛ්‍යාවක් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 6,630 වේ .

ඉඩම් කැබලි දෙකකට හිමිකම් කියනු ලබන ගොවි කාණ්ඩ සංඛ්‍යාව 29,576 කි. කැබලි දෙකක් යටතේ වැඩි ගොවි කාණ්ඩ සංඛ්‍යාවක් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එම සංඛ්‍යාව 3,935 කි.

බිම් කැබලි ගණන 3 ට හිමිකම් ඇති ගොවි කාණ්ඩ සංඛ්‍යාව 12,022 ක් වන අතර එයින් වැඩිම සංඛ්‍යාව (1,952) වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇත.

බිම් කැබලි ගණන 4, 5, 6 සහ 7හෝ ඊට වැඩි ගණනකට හිමිකම් ඇති ගොවිකාණඩ සංඛ්‍යාව පිළිවෙලින් 5,498, 2,497, 1,294, සහ 1,849වේ. බිම් කැබලි ගණන 4 , 5, 6 සහ 7 ට වැඩි බිම් කැබලි ප්‍රමාණයකට හිමිකම් කියනු ලබන ගොවි කාණ්ඩ වැඩිම සංඛ්‍යාවක් වරකාපොළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යා පිළිවෙලින් 942, 498, 267 හා 413 වේ.

## 3.16 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර) – 2014

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණයන් පිළිබඳව මෙමගින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.16 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර) – 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා බිම් ප්‍රමාණය (අක්කර) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1ට අඩු | | අක්කර 1-2 අතර | | අක්කර 2-3 අතර | | අක්කර 3-4 අතර | | අක්කර 4-5 අතර | |
| | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර |
| රඹුක්කන | 6,206 | 3,292 | 3,392 | 4,399 | 1,128 | 2,659 | 557 | 1,884 | 293 | 1,289 |
| මාවනැල්ල | 4,923 | 2,557 | 2,810 | 3,570 | 997 | 2,301 | 406 | 1,352 | 187 | 812 |
| අරණායක | 5,331 | 2,674 | 3,295 | 4,252 | 1,192 | 2,712 | 451 | 1,502 | 251 | 1,092 |
| කෑගල්ල | 5,841 | 3,004 | 2,420 | 3,149 | 897 | 2,085 | 359 | 1,196 | 191 | 830 |
| ගලිගමුව | 5,169 | 2,722 | 2,619 | 3,410 | 995 | 2,345 | 429 | 1,443 | 219 | 958 |
| වරකාපොල | 7,057 | 3,714 | 4,140 | 5,399 | 1,449 | 3,388 | 661 | 2,214 | 376 | 1,639 |
| රුවන්වැල්ල | 4,139 | 2,031 | 2,230 | 2,859 | 888 | 2,025 | 440 | 1,450 | 244 | 1,062 |
| බුලත්කොහුපිටිය | 4,787 | 1,934 | 1,802 | 2,303 | 892 | 2,021 | 304 | 1,009 | 144 | 619 |
| යටියන්තොට | 3,574 | 1,729 | 1,955 | 2,444 | 896 | 2,006 | 346 | 1,127 | 199 | 845 |
| දෙහිඕවිට | 5,306 | 2,455 | 2,628 | 3,291 | 1,063 | 2,384 | 433 | 1,408 | 245 | 1,025 |
| දැරණියගල | 3,324 | 1,523 | 2,337 | 2,930 | 1,216 | 2,692 | 462 | 1,516 | 267 | 1,134 |
| **එකතුව** | **55,657** | **27,633** | **29,628** | **38,006** | **11,613** | **26,618** | **4,848** | **16,100** | **2,616** | **11,306** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා බිම් ප්‍රමාණය (අක්කර) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 5-10 අතර | | අක්කර 10-20 අතර | | අක්කර 20-50 අතර | | අක්කර 50 ට වැඩි | | මුළු සංඛ්‍යාව | |
| | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර |
| රඹුක්කන | 429 | 2,879 | 147 | 1,982 | 37 | 1,014 | - | - | 12,189 | 19,398 |
| මාවනැල්ල | 348 | 2,304 | 122 | 1,588 | 14 | 369 | - | - | 9,807 | 14,853 |
| අරණායක | 315 | 2,035 | 61 | 769 | 9 | 231 | - | - | 10,905 | 15,265 |
| කෑගල්ල | 274 | 1,770 | 85 | 1,089 | 6 | 166 | - | - | 10,073 | 13,289 |
| ගලිගමුව | 355 | 2,332 | 93 | 1,219 | 15 | 392 | - | - | 9,894 | 14,821 |
| වරකාපොල | 605 | 4,089 | 174 | 2,267 | 29 | 732 | - | - | 14,491 | 23,443 |
| රුවන්වැල්ල | 408 | 2,762 | 114 | 1,537 | 19 | 554 | 2 | 110 | 8,484 | 14,390 |
| බුලත්කොහුපිටිය | 194 | 1,250 | 51 | 687 | 4 | 113 | 1 | 50 | 8,179 | 9,986 |
| යටියන්තොට | 267 | 1,736 | 78 | 1,010 | 8 | 221 | - | - | 7,323 | 11,118 |
| දෙහිඕවිට | 385 | 2,510 | 115 | 1,530 | 13 | 363 | - | - | 10,188 | 14,966 |
| දැරණියගල | 363 | 2,394 | 100 | 1,276 | 13 | 340 | - | - | 8,082 | 13,804 |
| **එකතුව** | **3,943** | **26,061** | **1,140** | **14,954** | **167** | **4,496** | **3** | **160** | **109,615** | **165,334** |

කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සලකා බැලූ විට අක්කරයට අඩු බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ සංඛ්‍යාව 55,657 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 27,633 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 7,057 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 3,714 කි. එය අක්කරයට අඩු බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 13.4% ක ප්‍රතිශතයකි.

එසේම අක්කර 1-2 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 29,628 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 38,006 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 4,140 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 5,399 කි . එය අක්කර 1-2 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 14.2% ක ප්‍රතිශතයකි.

අක්කර 2-3 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 11,613 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 26,618 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 1,449 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 3,388 කි . එය අක්කර 2-3 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 12.7% ක ප්‍රතිශතයකි.

අක්කර 3-4 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 4,848 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 16,100 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 661 වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 2,214 කි . එය අක්කර 3-4 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 13.8% ක ප්‍රතිශතයකි.

අක්කර 4-5 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 2,616 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 11,306 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 376 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 1,639 කි . එය අක්කර 4-5 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 14.5% ක ප්‍රතිශතයකි.

අක්කර 5-10 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 3,943ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 26,061 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 605 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 4,089 කි . එය අක්කර 5-10 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 15.7% ක ප්‍රතිශතයකි.

අක්කර 10-20 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 1,140 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 14,954 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 174 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 2,267 කි. එය අක්කර 10-20 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 15.1% ක ප්‍රතිශතයකි.

අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 167 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 4,496 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනි එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 37 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 1,014 කි . එය අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 22.5% ක ප්‍රතිශතයකි.